## ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනය සහ එහි පරිපාලිතය - 2024

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ සහ එහි පරිපාලිතයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හා අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ආයතනයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේද අනුව දේපල පිරියත උපකරණ අවශ්‍යතාවය අනුව වසර 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකළ යුතු අතර ආයතනයේ (NIBM) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.2.1 (a) අනුව සෑම වර්ෂ 03 කට වරක් ප්‍රත්‍යාගණනය කරන බව දක්වා තිබුණද ආයතනය (NIBM) විසින් භාවිතා කරනු ලබන පිරිවැය රු.මිලියන1,455.25 ක් වූ වත්කම් පංති 05 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර ඇති බව. | ගිණුම්කරණ ප්‍රමිත හා ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගතයුතුය. |

#### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාවිත අයිතිය සහිත වත්කම්වල ක්‍රම ක්ෂය රු.මිලියන 2.85 ක් වැඩියෙන් කපාහැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා බදු පදනම මත වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කරනු ලබන බව. | භාවිත අයිතිය සහිත වත්කම්වල ක්‍රම ක්ෂය නිවැරදිව ගණනය කර ගැලපීම් සිදුකොට ගිණුම් පිළියෙල කල යුතුය. |
| (ආ) කල්බදු පොලී ගණනයේදී සිදු වූ දෝෂයක් හේතුවෙන් කල්බදු පොලී වියදම | නිවැරදි කරනු ලබන බව. | කල්බදු පොලී නිවැරදිව |

| | | |
|---|---|---|
| රු.මිලියන 0.78 කින් වැඩිවී තිබූ අතර එහි නිවැරදි කිරීම වැරදි සහගතව සටහන් කිරීම හේතුවෙන් ඉහත දෝෂයට අමතරව කල්බදු වගකීම රු.මිලියන 0.78 කින් අඩුවී තිබූ අතර පෙර වර්ෂයේ රඳවාගත් ලාභ ශේෂය රු.මිලියන 1.56 කින් අධිගණනය වී තිබුණි. | | ගණනය කර ගිණුම් වලට ඇතුලත් කල යුතුය. |

### 1.5.3 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයට (NIBM) පූර්ණ අයිතිය හිමි පරිපාලිත සමාගමක් වූ ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනය (NSBM) 2024 ජුලි 15 වන දින එහි කොටස් අයිතිය අහෝසි කර රජය හෝ රජයට අනුබද්ධ ආයතනයකින් බැහැර තෙවන පාර්ශවයන් ඇපකරුවන් වූ ඇපයෙන් සීමිත සමාගමක් බවට පරිවර්තනය කර තිබුණි.<br><br>අඛණ්ඩව ලාභ ලබමින් හා වර්ධනය වෙමින් පැවති රජයට අයත් ආයතනයක පූර්ණ හිමිකාරීත්වය සහිත ආයතනයක් වන ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනයේ (NSBM) අදාල පරිවර්තන දිනට ශුද්ධ වත්කම්වල පොත් අගය රු.මිලියන 4,414.8 ක් වී තිබූ අතර රු.මිලියන 1,627.68 ක් ගෙවීමේ එකඟතාවය මත අයිතියෙන් බැහැර කර තිබුණි.<br>මෙම ගනුදෙනුව හේතුවෙන් ශුද්ධ වත්කම්වල පොත් අගයට සාපේක්ෂව රු.මිලියන 2,787.1 ක ඍජු අවාසියක් ආයතනයට (NIBM) සිදුවී ඇති අතර ලාභදායි හා අඛණ්ඩව වර්ධනය වෙමින් පැවැති තිරසර ව්‍යාපාරික ආයතනයක වෙළඳපල වටිනාකම මුළුමනින්ම තෙවන පාර්ශවයකට පවරා තිබුණි.<br><br>මෙම වත්කම බැහැර කිරීමේ අරමුණු අනුගමනය කරන ලද ක්‍රමවේදය හා විනිවිදභාවය ප්‍රශ්නකාරී වන අතර, අදාල පැවරුම් දිනට NSBM පැවැති වත්කම් හා වගකීම් සාධාරණ අගයකට තක්සේරුකර නොතිබුණි. | මෙම වත්කම් බැහැර කිරීමේ ක්‍රමවේදය රජයේ කැබිනට් මණ්ඩලය විසින් ගත් තීරණයට අනුව සිදු වූ බව හා NIBM ආයතනයේ පාලක මණ්ඩලය විසින් එම ප්‍රතිපත්තිමය තීරණය පරිදි ගත් තීන්දුව සඳහා අනුමැතිය ලබා දීම පමණක් සිදු කර ඇති බව. | වත්කම් බැහැර කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට විශේෂ වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව දන්වා ඇති අතර ඒ පිළිබඳව ලැබෙන නිර්දේශ මත ඉදිරියේදී ක්‍රියා කිරීමට කටයුතු කළ යුතුය. |

ඒ අනුව ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනයේ (NSBM) ආයෝජනය බැහැර කිරීම ඒ ආශ්‍රිත ගනුදෙනු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීම, මිණුම්කරණය හා ඉදිරිපත් කිරීම පිළිබඳව පවතින අවිනිශ්චිතතාවය හේතුවෙන් එම ගනුදෙනු විගණනයේදී සාධාරණ ලෙස තහවුරු කළ නොහැකි විය.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 184.55 ක ණයගැති ශේෂය තුළ වසර 02 ට වැඩි රු.මිලියන 63.58 ක ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ රු. බිලියන 2.76 ක් වන මුළු ආදායමින් රු. මිලියන 63.58 ක් යනු සියයට 2 ක් පමණක් බව හා එම තත්ත්වය අධ්‍යාපන ක්ෂේත්‍රයේ බහුලව දක්නට ලැබෙන බව. | හිඟ ණය කඩිනමින් අයකර ගැනීමට හා ණය අහිමිවීමට ඇති ඉඩකඩ අවම වන පරිදි පාලන ක්‍රම යෙදීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතේ 3.4 (X) | සෑම රාජ්‍ය ව්‍යවසායයකටම අනුප්‍රාප්තික සැලැස්මක් තිබිය යුතු වුවද, ආයතනය සඳහා එවැනි අනුප්‍රාප්තික සැලැස්මක් (Succession Plan) සකස් කර නොතිබුණි. | අනුප්‍රාප්තික සැළැස්ම සකස් කරමින් පවතින බව | නීති රීති ප්‍රකාරව අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කල යුතු අතර එය නිතර සමාලෝචන යට ලක් කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2454.16 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 985.98 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 3440.14 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයට (NIBM) පූර්ණ අයිතිය හිමි පරිපාලිත සමාගමක් වූ ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනය සඳහා සිදුකළ ආයෝජනය සාධාරණ අගයකට බැහැර නොකිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 02 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) විසින් විගණකාධිපතිගේ නිරීක්ෂණ සමාලෝචනය කරමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා එක්ව දිරිදීමනා ගණනය කිරීම සඳහා පිළිගත හැකි ක්‍රමවේදයක් සකසන ලෙසට උපදෙස් ලබා දී තිබුණද, මෙම වාර්තාවේ දිනය දක්වා එම කාර්යය නිම කර නොතිබුණි. | නව දිරිදීමනාව ගණනය කිරීමේ ක්‍රමවේදය සකස්කර රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2022 ජනවාරි 21 දින අනුමැතිය සඳහා යොමු කළද මෙතෙක් අනුමැතිය ලබාගැනීමට නොහැකි වී ඇති බව. | කෝප් නිර්දේශ මත සකස් කළ දිරිදීමනා ගණනය කිරීමේ ක්‍රමවේදයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනිමට කටයුතු කල යුතුය. |
| (ආ) | හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනය සතු පර්චස් 45 ක භූමිය, ආයතනයට පවරා ගැනීම සඳහා 2017 ජනවාරි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණ ද මෙම වාර්තාවේ දිනය දක්වාම අදාළ තීරණය ක්‍රියාත්මක කර ගැනීමට ආයතනය අපොහොසත්වී තිබුණි. | මෙම භූමි භාගය පවරා ගැනීම සඳහා ආයතනය විසින් රේඛීය අමාත්‍යාංශය හරහා අදාල ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරන ලද නමුත්, අමාත්‍ය මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කිරීමට හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනය මේ දක්වා කටයුතු කර නොමැති බව. | අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනය සතු ඉඩම ආයතනයට (NIBM) පවරා ගැනීම සඳහා කටයුතු කල යුතුය. |
| (ඇ) | ආයතනය (NIBM) සතු කොළඹ හා අනෙකුත් ශාඛා 05 හි ස්ථාපනය කර ඇති ආපනශාලා මගින් ආදායම් ඉපැයීමට සේවක සුභසාධක සංගමයට පවරා දී තිබූ අතර කුලී ආදායම් ලෙස එමගින් වසරකට රු.මිලියන 1.26 ක් සේවක සුභසාධක සංගමය ලබාගෙන තිබුණි. එනමුත් ආපනශාලා නඩත්තු කටයුතු සහ පුටු, මේස උපකරණ ඇතුළු භෞතික පහසුකම්, ජලය, විදුලිය සඳහා වූ සියළු වියදම් ආයතනය මගින් දරා තිබුණි. නිසි ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර සේවා සපයන්නෙකු | පාලක සභාවේ අනුමැතිය මත ආයතනයේ අධීක්ෂණය යටතේ සුභසාධක සංගමය හරහා ආපනශාලාව පවත්වාගන යාමට අවසර ලබා දී ඇති අතර ඔවුන් ආපනශාලාව මැනවින් සිදුකරන බව හා ඉදිරියේදී ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කරමින් සුදුසු පාර්ශවයකට ආපනශාලාව ලබාදීමට කටයුතු කරන බව. | ආපනශාලා කුළියට දීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර සේවා සපයන්නෙකු තෝරා ගැනීමට කටයුතු කළ යුතු අතර එම ආදායම් NIBM ගිණුමට රැස් කලයුතුය. |

තෝරා ගත හැකිව තිබුණද එසේ නොකිරීමෙන් ආයතනයට ලබාගත හැකිව තිබූ කුලී ආදායම අහිමි වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1976 අංක 23 දරන පනත මඟින් ස්ථාපිත කර තිබුණු ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය (NIBM) සඳහා 2009 අගෝස්තු 12 දිනැති අංක 1614/11 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත උපාධි පිරිනැමීමේ අනුමැතිය ලබාදී තිබුණි. ඉන්පසු ආයතනයේ (NIBM) දේශීය උපාධි පාඨමාලාවන් පිරිනැමීමේ අනුමැතිය අත්හිටුවා ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනයට (NSBM) ලබා දුන් බව 2012 අගෝස්තු 13 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යවරයා ඇමතු ලිපියෙන් දන්වා තිබුණි. 2024 ජුලි 15 දින සිට ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව විද්‍යායතනය ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පරිවර්තනය කිරීම හේතුවෙන් එහි හිමිකාරිත්වය බැහැර වීමෙන් දේශීය උපාධි පිරිනැමීමේ අවස්ථාව සම්පූර්ණයෙන්ම ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයට අහිමිවී තිබුණී. | දේශීය උපාධි පිරිනැමීමේ අනුමැතිය ලබා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අයදුම්කළද, ආයතන පනතේ උපාධි පිරිනැමීමේ කොටස කෙටුම්පත් කර පාලක සභාවේ අනුමැතිය සහිතව රේඛීය අමාත්‍යාංශය වන අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා යොමු කරන ලද බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් දේශිය උපාධි පිරිනැමීමේ අයිතිය NIBM ආයතනයට නැවත ලබාගැනීමට කටයුතු කර ආදායම වැඩි කර ගනිමින් ආයතනයේ පැවැත්ම තහවුරු කරගත යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙවන මහලේ පිහිටි අන්තර්ජාතික ඒකකය (International Academic Division) නවීකරණය කිරීම සඳහා උපදේශන සේවා ගාස්තු ලෙස 2023 සැප්තැම්බර් 01 දින සහ 2023 ඔක්තෝම්බර් 24 දින රු.මිලියන 1.75 ක් ගෙවා තිබුණද එම කාර්යය සිදු වී නොමැති<br><br>බැවින් එම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | උපදේශන ආයතනය විසින් සකස් කර ඉදිරිපත් කරන ලද රු. මිලියන 90ක ඇස්තමේන්තුගත Drawings 3D's සහ BOQ සඳහා ගෙවිය යුතු උපදේශණ ගාස්තුවලින්<br><br>සියයට 70 ක් ගිවිසුමට අනුව ගෙවූ බව හා ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන | දෙවන මහලේ පිහිටි අන්තර්ජාතික ඒකකය නවීකරණය කිරීම සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට හෝ එසේ නොවේනම් අදාල වියදම වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට |

| | | |
|---|---|---|
| | කටයුතු ඉදිරියේදී සිදුකිරීමට සැළසුම් කර ඇති බව. | හෝ කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව ආයතනයෙහි ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු , දෙවන හා තෙවන මහලෙහි යෝජිත අභ්‍යන්තර නවීකරණ කටයුතු පිළිබඳ වූ ව්‍යාපෘතියේ දී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.20 (ආ) ට පටහැනිව අනාවරණය කරන ලද නිර්ණායකවලට අමතරව අතිරේක නිර්ණායක හඳුන්වා දී නැවත ඇගයීමක් සිදු කර තිබුණි .ඒ අනුව සුදුසුකම් සපුරන ලද අවම මිල ඉදිරිපත් කර තිබූ මුල් ආයතන දෙක අභිබවා තෙවැනියට අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය ප්‍රමුඛස්ථානයට පත්ව තිබුණු බැවින් සාර්වත්‍රික ප්‍රතිචාරාත්මක ලංසුකරු (Substantial Responsive Bidder) වෙත ටෙන්ඩරය නොලැබීම හේතුවෙන් රු.මිලියන 1.48ක පාඩුවක් ආයතනයට සිදුවී තිබුණි .ඉහත ඇගයීම තුළින් තෝරාගත් කොන්ත්‍රාත්කරු නියමිත කාලයට වඩා මාස 02 දින 15ක් (දින 75) ප්‍රමාදව ව්‍යාපෘතිය භාරදී තිබූ අතර එහි අඩුපාඩු රාශියක් සහිතව ව්‍යාපෘතිය නිමකර ඇති බව භෞතික පරීක්ෂාවේදී දක්නට ලැබුණි. ව්‍යාපෘතිය භාර දී වර්ෂ 01ක කාලයක් ඉක්මවා තිබුණද, අදාළ කොන්ත්‍රාත් සමාගම හරහා එම අඩුපාඩු සකස් කරවා ගැනීමට ආයතනය (NIBM) කටයුතු කර නොතිබුණි. | ලබාදිය හැකි උපරිම කාල දිගුව සලකා බලා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලින් අඩුකිරීමට තීරණය කර ඇති බව හා අඩුපාඩු සහිත කාර්යයන් සඳහා තක්සේරු කර අවසන් බිල්පතින් අඩුකර ගෙවීම, නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දුන් බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයට පටහැනි නොවන ලෙස කටයුතු කළ යුතු අතර අදාල කොන්ත්‍රාත්කරු හරහා පවතින අඩුපාඩු සකස් කර ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හා පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්යය මණ්ඩලයට අනුව 2024 දෙසැම්බර් 31 දිනට අනධ්‍යන හා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු පිළිවෙලින් 22ක් සහ 03ක් පුරප්පාඩුව පැවතුණි. | අදාළ පුරප්පාඩු පිරවීම සඳහා නිරන්තරයෙන් කටයුතු කරන බව. | අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නිතර සමාලෝචනය කරමින් පුරප්පාඩු |

| | | |
|---|---|---|
| | | ඇති නොවන ලෙස අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |
| (ආ) 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ සේවකයන් ඉවත් වීමේ ප්‍රවණතාවය ආයතනය තුළ වැඩි වී තිබුණ අතර ඒ අනුව සේවක පිරිවැටුම් අනුපාතය සියයට 2.97 සිට සියයට 15.86 ක් දක්වා වැඩි වී තිබුණි. | සටහන් කරගන්නා ලද බව. | සේවක පිරිවැටුම අඩුකර ගැනීම සඳහා රජයේ සහය ඇතිව නිශ්චිත වැඩපිළිවෙලක් සකස්කල යුතුය. |
| (ඇ) 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතන පනතේ 16(2) හා 16(5) වගන්ති ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව 2017 මාර්තු 06 දින සිට වසර 05 ක් සඳහා වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර තිබුණද අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව එදිනට අවම සුදුසුකම් සපුරා නොතිබුණි. | 2016 වර්ෂයේ දී කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව 1976 අංක 23 දරණ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව පනත ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වයස සීමාවකින් තොරව වසර පහක් කාලයක් සඳහා රේඛීය අමාත්‍යාංශයෙහි අමාත්‍යවරයා විසින් අදාල පත්කිරීම සිදුකර ඇති බව. | ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව පනත හා බඳවා ගැනීමේ පටිපාටිය අනුව කටයුතු කළ යුතුය. |